මගේ අංකය : JSC/SEC/CIR – L/2022

සියලුම මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ සියලුම අධිකරණ නිලධාරීන් වෙත,

<u>අමාත්‍යාංශය මඟින් සැලසුම් කර ඉදිකරන ව්‍යාපෘති සම්බන්ධවයි.</u>

ශීර්ෂගත කරුණට අදාලව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් මා අමතන ලද 2022.10.07 දිනැති ලිපියක් පිළිබඳව සලකා බැලූ අධිකරණ සේවා කොමිෂන් සභාව,අවශ්‍ය කටයුතු සඳහා එම ලිපිය ඔබගේ අවධානයට ලක් කරන ලෙසට මට නියම කර ඇත.

02. ඒ අනුව, 2022.10.07 දිනැති ලිපිය මේ සමඟ අමුණා ඔබගේ අවධානයට ඉදිරිපත් කරමි.

අධිකරණ සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එස්. සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව.

එච්. සංජීව සෝමරත්න
ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

2022 නොවැම්බර් මස 04 වෙනි දින,
කොළඹ 12,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලයේදීය.

ලේකම්
செயலாளர்
Secretary

දුරකථනය
தொலைபேசி
Telephone
2449959

ෆැක්ස් අංකය
பெக்ஸ் இல.
Fax No.
2445447

E-Mail: secretary@moj.gov.lk

ප්‍රධාන කාර්යාලය
பொது அலுவலகம்
General Office

දුරකථනය
தொலைபேசி
Telephone
2323022

ෆැක්ස් අංකය
பெக்ஸ் இல.
Fax No.
2320785

Web Site: www.moj.gov.lk

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය

நீதி, சிறைச்சாலை அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சு

**Ministry of Justice, Prison Affairs and Constitutional Reforms**

ANNEXE A

තැපැල් පෙට්ටිය
தபாற்பெட்டி
P.O. Box.
555

ඉලෙක්ට්‍රොනික තැපැල
மின்அஞ்சல்
E-mail
info@moj.gov.lk

නො 19, ශ්‍රී සංඝරාජ මාවත
කොළඹ 10

இல 19, ஸ்ரீ சங்கராஜ மாவத்த
கொழும்பு 10

No 19, Sri Sangaraja Mw
Colombo 10

මගේ අංකය / எனது இல / My No.: MOJ/ENG/CON/COMMON/2022

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2022.10.07

B/H

10 OCT 2022

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ 12

<u>අමාත්‍යාංශය මගින් සැලසුම් කර ඉදිකරන ව්‍යාපෘති සම්බන්ධවයි.</u>

කාලීන අවශ්‍යතා මත පදනම්ව නව අධිකරණ ඉදිකිරීම් හා පවතින අධිකරණයන්හි පහසුකම් වැඩිදියුණු කිරීම හා අලුත්වැඩියා කිරීම අධිකරණ අමාත්‍යාංශය මගින් සිදුකරයි.

02. එහිදී අවශ්‍යතා නිසි පරිදි හඳුනා ගැනීමෙන් පසු අදාළ සැලසුම්පත් සහ ප්‍රමාණ බිල්පත්‍ර සකස් කිරීම සිදුකරන අතර මූල්‍ය ප්‍රතිපාදන ඒ සඳහා උපයෝජනය කරනු ලැබේ. එහිදී එකී සැලසුම් පසුකාලීනව වෙනස් කරන්නේ නම් ඒ පිළිබඳ අමාත්‍යාංශය දැනුවත් විය යුතු වේ.

03. නමුත්, ඇතැම් අධිකරණ ගොඩනැගිලි ඉදිකිරීමේදී ඒවායේ සැලසුම්, අමාත්‍යාංශයේ අවසරයක් නොමැතිව වෙනස් කරන අවස්ථා නිරීක්ෂණය වේ. මෙසේ සැලසුම් වෙනස් කිරීම නිසා ඇති වන ගැටළු පිළිබඳ දන්වා විගණන විමසුම් ද ඉදිරිපත් වී ඇත.

04. එබැවින්, යම් ඉදිකිරීම් කටයුත්තකට අදාළ සැලසුම් සම්බන්ධ ගැටලු පවතින්නේ නම් ඒ පිළිබඳ අමාත්‍යාංශය දැනුවත් කර අවශ්‍ය වෙනස්කම් වේ නම් ඒ සම්බන්ධයෙන් මෙම අමාත්‍යාංශයේ අනුමැතිය ලබා ගත යුතු බව අධිකරණ විනිසුරුවරුන් වෙත දන්වා යැවීම සුදුසු බවට යෝජනා කරන අතර, ඒ සම්බන්ධව ඔබ කොමිසමේ සහාය ලබා දෙන ලෙස මෙයින් කාරුණිකව ඉල්ලා සිටිමි.

ලේකම්
අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා
ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය